*සැ. යු.-* 2013.05.17 දින පළවූ අංක 1811 දරන *ගැසට් පත්‍රයේ* I:III කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,812 - 2013 මැයි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2013.05.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 406 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 407 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | –– |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 407 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 408 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.-* (i) ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ඔට්ටු ඇල්ලීම හා සුදූ බදු (සංශෝධන) පනත් කෙටුම්පත, 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත, 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූනි මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මැයි මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 180

DRF/RECT/1076/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරිණී 2010 ජනවාරි මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

බ්‍රිගේඩියර් සුරවීර ආරච්චිගේ දෝන ශ්‍රියානි වරුසවිතාරණ, යූඑස්පී (නි/60046)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2009 ඔක්තෝබර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

05 -596

---

2013 අංක 181

MOD/DEF/02/01/ARF/PRO/COL/06.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම හා නිල උසස් කිරීම්

**ස්ථිර කිරීම්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2005 දෙසැම්බර් මස 23 වැනි දින සිට ලුතිතන් කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

තාවකාලික ලුතිතන් කර්නල් කෝරල ගමගේ මාලන් සුජීව ප්‍රනාන්දු, ශ්‍රීලසසබ

**උසස් කිරීම්**

2. පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 2013 ජනවාරි මස 10 වැනි දින සිට තාවකාලික කර්නල් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

(අ) ලුතිතන් කර්නල් එච්එම්එන්බී හේරත්, ශ්‍රීලංසිරෙ
(ආ) ලුතිතන් කර්නල් සීඑච්එම්සීපී චන්ද්‍රසේකර, කරෙ
(ඇ) ලුතිතන් කර්නල් ඩබ්එම්සී බණ්ඩාර, ශ්‍රීලංසිරෙ
(ඈ) ලුතිතන් කර්නල් කේජීඑම්එස් ප්‍රනාන්දු, ශ්‍රීලසසබ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

05 -595

---

2013 අංක 182

MOD/DEF/2/01/ARF/RET/317.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරිණී 2013 අප්‍රේල් මස 30 වැනි දින සිට තාවකාලික මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

තාවකාලික මේජර් වාසල මුදියන්සේලාගේ වජිරා රන්මැණිකේ ධර්මපාල එදිරිසිංහ, ඉසේබ (නි/64659)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරිණී 2013 මැයි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

මේජර් වාසල මුදියන්සේලාගේ වජිරා රන්මැණිකේ ධර්මපාල එදිරිසිංහ, ඉසේබ (නි/64659)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

05 -594

2013 අංක 183

MOD/DEF/02/01/ARF/COR/304.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අනිවාර්ය විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2005 දෙසැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

කපිතාන් රත්නායක මුදියන්සේලාගේ මහින්ද රත්නායක, ආර්එස්පී විපාරෙ (නි/60883)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

05 -697

DRF/21/RECT/3049.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2009 මැයි මස 05 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

ලුතිතන් ක්‍රිෂ්ණදාස මුදියන්සේලාගේ මිලන්ද දමිත බණ්ඩාර, කරෙ (නි/65841)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2010 මාර්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.

05 -549

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 184

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ අජන්ත කුමාරසිරි මහතා 2013 මාර්තු මස 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

05 -639

## රජයේ නිවේදන

මගේ යොමු අංක : ඊඩී/1/8/1/කො/50.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26, 27 සහ 33 වැනි වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 03(06)(අ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, මල්වත්ත, දකුණු හෝකන්දර, ශ්‍රී සම්බුද්ධ ජයන්ති දක්ෂිණාරාම විහාරස්ථානයේ පිහිටි කො/ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති ද්විභාෂා මූලික පිරිවෙන 2012.02.07 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරී ස්වාමින් වහන්සේ වන පූජ්‍ය ගෝනදෙණියේ නිබිලසිරි ස්වාමින් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝගමාලාවේ 03(06) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත් මෙම දැන්වීම පළ වී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2013 අප්‍රේල් මස 26 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

05 - 708

**වට්ටාපලයි කන්නකි අම්පාල් පොංකල් උත්සවය - 2013**

මුලතිව් දිස්ත්‍රික්කය

ඉහත සඳහන් පොංකල් උත්සවය 2013 මැයි මස 20 වැනි දින පෙරවරු 6.00ට පටන්ගෙන 2013 මැයි මස 28 වැනි දින පෙරවරු 6.00ට අවසන් වන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ පිළිබඳව 1949 මැයි මස 27 වැනි දින අංක 9978 හා 1950 මැයි මස 26 වැනි දිනැති අංක 10105 දරන රෙගුලාසිවලට පොදු ජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගුවනවා ඇත.

එන්. වෙදනායහන්,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
මුලතිව් දිස්ත්‍රික්කය.

2013 මැයි මස 01 වැනි දින.

05 - 532

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන), අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 මාර්තු මස 01 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන්නප්පුව, නැගෙනහිර දුම්මලදෙණිය අංක 100 යන ස්ථානයේ සහ නයිනමඩම, නැගෙනහිර නයිනමඩම "සුමේධ" යන ස්ථානයේ පදිංචි මුතුනාමගොන්නගේ මේරියන් ස්ලේටන් සුමේධ ප්‍රනාන්දු නොහොත් මුතුනාම ගොන්නගේ මේරියන් ස්ලේටන් සුමේධ ප්‍රනාන්දු යන අය (මෙහි මින්මතු "උකස්කරු" වශයෙන් හඳුන්වනු ලබන) යූනියන් බැංකුවෙන් බැංකු පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, ඉහත කී පහසුකම නිසා එකී උකස්කරු, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. එල්. පී. ධම්මික සිල්වා විසින් සහතික කරන ලද අංක 1603 සහ 2011.10.27 වැනි දින දරන උකස් බැඳුම්කරය ලියා අත්සන් කිරීමෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ, යූනියන් බැංකුව වෙත ගෙවිය යුතු වන රුපියල් එක්කෝටි හතළිස් පන්ලක්ෂයක (රු. 1,45,00,000) මුදල සහ ඒ මත පොලිය ආපසු ගෙවීම සඳහා සුරැකුමක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඒ අනුව ඉහත කී ණය මත 2012.08.30 වැනි දිනට රුපියල් එක්කෝටි හතළිස් එක්ලක්ෂ හැත්තෑදෙදහස් තුන්සිය විස්සකුත් ශත අනූහතරක (රු. 1,41,72,320.94) මුදලක් සහ ඒ මත 2012.08.31 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට කල් ඉකුත් වූ පොලිය ද එකී උකස්කරුගෙන් යූනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂය එකී උකස්කරු විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත සඳහන් ණය පහසුකම මත රුපියල් එක්කෝටි හතළිස් එක්ලක්ෂ හැත්තෑදෙදහස් තුන්සිය විස්සකුත් ශත අනූහතරක (රු. 1,41,72,320.94) මුදල සහ ඒ මත 2012.08.31 වැනි දින සිට වර්ෂයකට කල් ඉකුත් වූ පොලිය ද, තවද, ඉහත කී අංක 1603 දරන බැඳුම්කරය සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1603 දරන උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ඉහත කී 1990 අංක 4 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරුවන් වන ත්‍රිවංක ඇන්ඩ් සේනානායක වෙත බලය පැවරීමට 1990 අංක 4 රදන එකී පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ නැගෙනහිර දුම්මලදෙනියේ මාදන්ගහඕවිට සහ ගලයාය නොහොත් කැටකැලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. සුමිත් ඒ. ප්‍රනාන්දු මහතා විසින් මැන සාදන ලද අංක 3530 සහ 2011.08.13 දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1, 2, 3, 4, 5 සහ 6 දරන බෙදා වෙන් කළ බිම් කොටස්වලට මායිම් උතුරට : බලයලත් මිනින්දෝරු වයි. එම්. රන්ජිත් යාපා මහතා විසින් මැන සාදන ලද අංක 8531 දරන පිඹුරේ කැබලි අංක 1 දරන පාර (අඩි 15ක් පළල) ද නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු වයි. එම්. රන්ජිත් යාපා මහතා විසින් මැන සාදන ලද අංක 8531 දරන පිඹුරේ කැබලි අංක 4 සහ එස්. කේ. ද සිල්වා යන අය හිමිකම් කියන ඉඩම ද, දකුණට : අනුර සම්පත් යන අය හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : මාර්ග සංවර්ධන අධිකාරියේ කොළඹ - හලාවත මහා මාර්ගය ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිහතකුත් දශම නවයයි පහක් (අ. 0 රූ. 0 පර්. 27.95) විශාල ඉඩම් කැබලි සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

ඉහත කී ඉඩම වනාහි පහත විස්තර කරන ඉඩම්වල ඒකාබද්ධ කිරීමක් වේ.

4. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරලේ කම්මල් පත්තුවේ, නැගෙනහිර දුම්මලදෙනියේ පිහිටි මාදන්ගහඕවිට සහ ගලයාය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. එම්. රන්ජිත් යාපා මහතා විසින් මැන සාදන ලද අංක 8531 සහ 2003.02.21 දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 2 සහ 3 දරන බෙදා වෙන් කළ බිම් කොටස්වලට මායිම්, උතුරට : කැබලි අංක 1 ද, නැගෙනහිරට : කැබලි අංක 4 ද, දකුණට : සුමේධා සහ රන්ජන් යන අයගේ ඉඩම ද, බස්නාහිරට : මාර්ග සංවර්ධන අධිකාරියේ පාර ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 9.5) විශාල ඉඩම් කැබලි සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලුදේත් සමගය. මෙම දේපළ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 120/233 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

5. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරලේ, කම්මල් පත්තුවේ නැගෙනහිර දුම්මලදෙනියේ පිහිටි මාදන්ගහඕවිට සහ ගලයාය නොහොත් කැටකැලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක මහතා විසින් මැන සාදන ලද අංක 1621 ඒ සහ 2001.02.14 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 3, 4, 5 සහ 6 දරන බෙදා වෙන් කළ බිම් කොටස්වලට මායිම් උතුරට : කැබලි අංක 1 සහ 2 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ටී. එච්. ආර්. බර්නාඩ් අප්පුහාමි යන අයට අයිති ඉඩම් කොටස ද, දකුණට : සී. එම්. චාර්ලි යන අයගේ ඉඩම ද, බස්නාහිරට : කොළඹ හලාවත පාර ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහඅටයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 18.5) විශාල ඉඩම් කැබලි සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලුදේත් සමග ය. මෙම දේපළ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 90/232 දරන වෙලුමේ / පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

6. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරලේ, කම්මල් පත්තුවේ, නැගෙනහිර දුම්මලදෙනියේ පිහිටි මාදන්ගහඕවිට සහ ගලයාය නොහොත් කැටකැලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක මහතා විසින් මැන සාදන ලද අංක 1621 A සහ 2001.02.14 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 සහ 2 දරන බෙදා වෙන් කළ බිම් කොටස්වලට මායිම් උතුරට : සී. ජයලත් යන අය හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ටී. එච්. ආර්. බර්නාඩ් අප්පුහාමි යන අයට අයිති ඉඩම් කොටස ද, දකුණට : කැබලි අංක 3 ද, බස්නාහිරට : කොළඹ හලාවත මහා මාර්ගය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම දහසයක් (අ. 0 රූ. 0 පර්. 2.16) විශාල ඉඩම් කැබලි සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලුදේත් සමග ය. මෙම දේපළ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 164/104 දරන වෙලුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද ඉහත කී අංක 8531 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05-686

---

පීවී 9469.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සෙසානො ෂූ කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2006.09.13 දින සංස්ථාපිත සමාගමක් වන "සෙසානො ෂූ කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "සෙසානො ෂූ කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරී ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරී ඉටුකිරීම).

2013 මැයි මස 03 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

05 - 564

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.